ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2022-02-01 |

පැමිණිලි පාර්ශවය : පි.ජෙයන්ති මිය
කර්කස්වෝල්ඩ් වතුයාය,
බගවන්තලාව.

වින්දිත පාර්ශවය : කාලිමුත්තු විමලන්

වගඋත්තර පාර්ශවය :

1. උ.පො.ප.නන්දන සමන්සිරි මයා,
පොලිස් ස්ථානය,
මොණරාගල.

2. පො.කො. 73871 ශිවයෝගරාජා මයා,
පොලිස් ස්ථානය,
නල්ලතන්නිය.

3. පො.සැ. 55611 සුරේෂ් කුමාර් මයා,
පොලිස් ස්ථානය,
කන්කසන්තුරේ.

4. ස්ථානාධිපති,
පොලිස් ස්ථානය,
බගවන්තලාව.

<u>පැමිණිලි අංකය : **HRC/K/550/16**</u>

**පැමිණිල්ල :-**

ඉහත පැමිණිලි පාර්ශවය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් කියා සිටින්නේ, 2016.10.14 වන දින බගවන්තලාව පොලිසිය විසින් ප.ව. 2.00 ට පමණ තම නිවසට පැමිණ සොරකමක් සම්බන්ධයෙන් තමාගේ සැමියා වන කාලිමුත්තු විමලන් යන අයව සැකපිට අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානයට රැගෙන ගොස් ඔහුට දරුණු ලෙස පහරදී ඇති බවත්, එහිදී තම සැමියා විසින් අදාළ සොරකම සිදුනොකල බව පවසා ඇතත්, එය ඔහු විසින්ම සිදුකල බවට පිළිගන්නා මෙන් පොලිස් නිලධාරීන් විසින් තම සැමියාට තර්ජනය කර ඇති බවත්ය.

තවද, 2016.10.17 වන දින පෙ.ව.11.00 ට සැමියා නඩු විමර්ශනයට ඉදිරිපත් කරන බව පොලිසිය විසින් පවසා ඇතත්, එසේ නොකිරීම නිසා තමා බගවන්තලාව පොලිස් ස්ථානයට වෙත ගිය බවත්, එහිදී පොලිසිය විසින් තමාගෙන් ද ප්‍රශ්න කල බවත්, තමන් පොලිසියේ සිටින අතරතුර අනවසරයෙන් මැණික් ගැරීමක් සම්බන්ධව පොලිසිය විසින් තම නිවස පරික්ෂා කර ඇති බවත්, 2016.10.18 වන දින තම සැමියා නඩු විමර්ශනයට ඉදිරිපත් කර ඇති බවත්, ඔහුගෙන් කිසිදු ප්‍රශ්න කිරීමක් සිදුනොකර අනවසරයෙන් මැණික් ගැරීමේ චෝදනාව මත දඩයක් නියම කිරීමෙන් පසු රු. 5,000/- ක මුදලක් එදින ගෙවා නිදහස් වූ බවත්ය.

වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :-

පැමිණිල්ලට අදාළව කරුණු ඉදිරිපත් කරමින් වගඋත්තර පාර්ශවය සඳහන් කර ඇත්තේ, පැමිණිලිකාරියගේ සැමියා වන කාලිමුත්තු විමලන් යන අය සොරකමක් සඳහා 2016.10.14 වන දින ප.ව. 7.20 ට අත්අඩංගුවට ගෙන පසුදින එනම්, 2016.10.15 වන දින ප.ව. 5.30 ට අධිකරණ වෛද්‍ය වාර්ථාවක් ලබාගැනීමෙන් පසු ඇප මත මුදාහැර ඇති බවත්, ඒ අනුව 2016.10.20 දින මෙම සැකපිට අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් AR වාර්තාවක් යටතේ අධිකරණය වෙත කරුණු වාර්තා කර ඇති බවත්ය.

පසුව 2016.10.17 වන දින පොලිසියට ලද තොරතුරක් මත මෙම කාලිමුත්තු විමලන් යන අය කර්කසෝල් වත්තේ මැද කොටසේ අනවසරයෙන් මැණික් ගරමින් සිටියදී ප.ව. 5.00 ට අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇති බවත්, එදිනම අධිකරණ වෛද්‍ය වාර්තාවක් ලබාගෙන 2016.10.18 දින හැටන් මහේස්ත්‍රාත් අධිකරණය වෙත අනවසර මැණික් ගැරීමේ චෝදනාව මත ඉදිරිපත් කර ඇති බවත්ය. එහිදී පැමිණිලිකාරියගේ සැමියා වන කාලිමුත්තු විමලන් යන අය විසින් වරද පිළිගැනීමෙන් පසු රු.10,000/- ක දඩයකට යටත් කර ඇති අතර, එදින අධිකරණය වෙත රු.5,000/- ක මුදලක් ගෙවීමෙන් පසු ඇප මත මුදාහැර ඇති බවත්, ඒ අනුව පැමිණිලිකාරියගේ සැමියා තම පොලිස් නිලධාරීන් විසින් අවස්ථා දෙකකදී අත්අඩංගුවට ගෙන ඇති බවත්, අත්අඩංගුවේ සිටි කාල සීමාවේදී කිසිදු පහරදීමක් සිදුවී නොමැති බවත්ය.

විමර්ශනයේදී අනාවරණය වී ඇති කරුණු :-

1. පැමිණිල්ල කෙරෙහි අවධානය යොමු කිරීමේදී පැමිණිලිකාරියගේ සැමියා වගඋත්තර පාර්ශවය විසින් අත්අඩංගුවට ගෙන නඩු පැවරීමක් සිදුවූ බව නිරීක්ෂනය වී ඇත. එහිදී පැමිණිලි පාර්ශවය දන්වා සිටින්නේ තම සැමියා 2016.10.14 වන දින නිවසේ සිටියදී අත්අඩංගුවට ගෙන දින 03 ක් රඳවා තබාගෙන පහර දී 2016.10.18 වන දින අධිකරණය වෙත ඉදිරිපත් කර ඇප මත මුදාහැරි බවයි.

2. නමුත් වගඋත්තර පාර්ශවය පවසා සිටින්නේ 2016.10.14 වන දින පැමිණිලිකාරියගේ සැමියා අත්අඩංගුවට ගෙන පසුදින ඇප මත නිදහස් කල බවත්, නැවත 2016.10.17 වන දින ඔහු කර්කසෝල් වත්තේ මැණික් ගරමින් සිටියදී අත්අඩංගුවට ගෙන 2016.10.18 දින අධිකරණයට ඉදිරිපත් කර ඇප මත නිදහස් කල බවයි.

3. පැමිණිලිකාරියගේ සැමියාට පහරදීම සම්බන්ධයෙන් වගඋත්තරකාර පොලිස් නිලධාරීන්ට එරෙහිව 2017.10.15 වන දින ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති විසින් චෝදනා පත්‍ර නිකුත් කර ඇති අතර එහි ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ පළමුවන උපලේඛනය යටතට ගැනෙන චෝදනාවන් වන අපකීර්තිදායක හැසිරීම, අණට අකීකරු හෝ පීඩාකාරි ලෙස හැසිරීම හා බොරුකීම හෝ ඇත්ත සඟවා කතා කිරීම යන චෝදනාවන්

සඳහන් කර ඇත. තවද, මෙම සිදුවීම සම්බන්ධයෙන් හඳුනාගැනීමේ පෙරට්ටුවක් ද බගවන්තලාව පොලිසියේදී පවත්වා ඇති අතර, එහිදී පැමිණිලි පාර්ශවය විසින් පහරදුන් නිලධාරීන් හඳුනාගෙන ඇත.

4. පැමිණිලිකාරියගේ සැමියා වන කාලිමුත්තු විමලන් යන අය 2016.10.14 සිට 2016.10.18 දින දක්වා රඳවා තබාගෙන සිටිනු දුටු බවට සූරියන් දයාසීලන් සහ පෙරියසාමි රවීන්ද්‍රන් යන දෙදෙනා විසින් සාක්ෂි ඉදිරිපත් කර ඇති අතර, එමගින් අභතියට පත් කාලිමුත්තු විමලන් යන අය නීතිවිරෝධී ලෙස දින 04 ක කාලයක් බගවන්තලාව පොලිස් ස්ථානයේ රඳවා තබාගෙන සිටි බවට තහවුරු වේ.

5. පැමිණිලිකාරියගේ සැමියාට සිදුවූ පහරදීම් සනාථ කිරීම සඳහා අධිකරණ වෛද්‍ය වාර්තාවක් ඉදිරිපත් කර ඇති අතර, අදාළ වෛද්‍ය වාර්තාව කෙරෙහි අවධානය යොමු කිරිමේදී කාලිමුත්තු විමලන් යන අය 2016.10.18 වන දින රෝහල්ගත වී 2016.10.21 වන දින රෝහලෙන් පිටවී ඇති බව නිරීක්ෂණය වේ.

6. වින්දිත පාර්ශවයට සිදුවූ පහරදීම හේතුවෙන් හිසේ වේදනාව, පපුවේ වේදනාව සහ කොන්දේ වේදනාව තිබෙන බවත්, දත් කිහිපයක් අහිමි වූ බවත්, කන් ප්‍රදේශයට පහරදුන් බවත් සඳහන් කර ඇති අතර, එය අධිකරණ වෛද්‍ය වාර්තාවේ තුවාල වල විස්තර හා සැසදේ. ඒ අනුව අධිකරණ වෛද්‍ය වාර්තාව මඟින් හිසේ පිටුපස සෙ.මී.1 X 1.5 ප්‍රමාණයේ තුවාලයක් සහ කන් බෙරයේ තැල්මක් ඇති බව සඳහන් කර ඇත.

7. මේ අනුව ඇසින් දුටු සාක්ෂි, අධිකරණ වෛද්‍ය වාර්තාව හා සිද්ධිමය කරුණු තුළින් පැමිණිලිකාරියගේ සැමියා වන කාලිමුත්තු විමලන් යන අය වධහිංසාවට ලක්වී ඇති බවත්, දින 04 ක් නීතිවිරෝධී ලෙස රඳවා තබාගෙන සිටි බවත් තහවුරු වේ.

නිගමනය :-

මේ අනුව ඉහත කරුණු සියල්ල කෙරෙහි අවධානය යොමු කිරීමේදී වගඋත්තර පාර්ශවය විසින් පැමිණිලි පාර්ශවීය පී.ජෙයන්ති යන අයගේ ස්වාමියා වන කාලිමුත්තු විමලන් යන අය වධහිංසාවට ලක් කිරීමක් හා නීතිවිරෝධී ලෙස රඳවා තබාගැනීමක් සිදුවී ඇති බව නිරීක්ෂණය වන අතර, ඒ තුළින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වන පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාව මඟින් සහතික කොට ඇති කෲර, අමානුෂික දඬුවමකට හෝ අවමන් සහගත සැලකිල්ලට භාජනය නොවීමේ මූලික අයිතිවාසිකම හා 13 (2) වන ව්‍යවස්ථාවෙන් තහවුරු කර ඇති නීතිවිරෝධී ලෙස රඳවා තබා ගැනිමෙන් වැලකීමේ නිදහස යන මූලික අයිතිවාසිකම වගඋත්තරකාර පාර්ශවය විසින් උල්ලංඝනය කර ඇති බව නිගමනය කරමි.

නිර්දේශය :-

1. එබැවින්, වින්දිත පුද්ගලයා වන කාලිමුත්තු විමලන් යන අයගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරිම හේතුවෙන් වගඋත්තර පාර්ශවය විසින් වින්දිත කාලිමුත්තු විමලන් යන අයට වන්දි වශයෙන් රු. 10,000/- ක මුදලක් ගෙවිය යුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2. එසේම, වගඋත්තර පාර්ශවයේ ඉහත ක්‍රියාකලාපය සම්බන්ධයෙන් මේවනවිට විනය පියවර ගෙන ඇති බැවින්, ඒ පිළිබඳව ප්‍රගතිය වාර්තා කිරීමට පොලිස්පති සහ අධ්‍යක්ෂ, මානව හිමිකම් කොට්ඨාශය වෙත මෙම නිර්දේශයේ පිටපතක් යොමු කරනු ලැබේ.

3. 1994 අංක 22 දරණ වධදීමට හා අනිකුත් කෲර, අමානුෂික හෝ නින්දිත සැලකීමට හෝ දඩුවම් වලට එරෙහි වූ සම්මුතිය පනත යටතේ වගඋත්තර පාර්ශවය වෙත නඩු පැවරීම සඳහා නීතිපති වෙත ද මෙම නිර්දේශයෙහි පිටපතක් යොමු කරනු ලැබේ.

2022.02. 28 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තර පාර්ශවය වෙත මෙයින් දන්වා සිටිමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලි පාර්ශවය විසින් ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාව වෙත දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම්, පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බව ද වැඩිදුරටත් දන්වමු.

රෝහිණී මාරසිංහ,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
සභාපතිනි,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු රෝහිණී මාරසිංහ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

පිටපත :- 01. පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොළඹ.

02. නීතිපති,
නීතිපති දෙපාර්තමේන්තුව,
කොළඹ.

03. අධ්‍යක්ෂ,
මානව හිමිකම් කොට්ඨාශය,
අංක : 07, 7 වන මහල,
එන්.එම්.පෙරේරා මාවත,
කොළඹ 08.

සැ.යු. - අදාළ මුදල "මුදල් ඇණවුමක්" මඟින් පැමිණිලි පාර්ශවය වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාව වෙත ලැබීමට සැලැස්විය යුතුය.

ස/-